චක්‍රලේඛ අංක :12/2016

මගේ අංකය : කේ05/5/විවිධ/[illegible]/2016
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2016-02-13 වන දින.

බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරී වෙත .

<u>සිරකරුවන්ගේ නිවාස නිවාඩු නිර්දේශයන් ප්‍රමාදවී ඉදිරිපත් කිරීම පිළිබඳවයි.</u>

බන්ධනාගාර ආයතන විසින් ප්‍රථමවරට නිවාස නිවාඩු සුදුසුකම් ලබන සිරකරුවන්ගේ අදාල නිර්දේශයන් නියමිත දිනයේ සිට ඉදිරියට වසර ගනන් දක්වා ප්‍රමාදවී නිවාස නිවාඩු යැවීමට නිර්දේශ කර එවනු ලබන බවට වාර්තා වී ඇත . එම ප්‍රමාදවීම් වලට අදාල හේතු බන්ධනාගාර ආයතන විසින් ඉදිරිපත් කර නොතිබීම ගැටළු සහගත තත්ත්වයකි. එබැවින් මින් ඉදිරියේදී බන්ධනාගාර ආයතන භාර අධිකාරීවරුන් සහ සහකාර අධිකාරීවරුන් විසින් මේ සම්බන්ධයෙන් පවතින නීති රීතිවලට අමතරව පහත සඳහන් පරිදි ක්‍රියා කළ යුතු බව මින් දන්වමි.

1. නිශ්චිත සිර ද!ඩුවම් නියමව බන්ධනාගාර ගතවන සිරකරුවන් වෙනුවෙන් දඩුවම ආරම්භයේ දීම <u>බලපත්‍ර සහ නිවාස නිවාඩු</u> සඳහා සුදුසුකම් ලබන දිනය සඳහා කැලැන්ඩරයක් පවත්වා ගත යුතු අතර, එය නිසි පරිදි යථාවත් කළ යුතුය .

2. නිවාස නිවාඩු අවස්ථාව උදා කර ගැනීමෙන් පසු ඉදිරි නිවාස නිවාඩු අවස්ථාව ද කැලැන්ඩර ගත කර අවශ්‍ය පරිදි අදාල ආයතන භාර ප්‍රධාන පුනරුත්ථාපන නිළධාරීන් වෙත භාර දීම සිදුකල යුතුය .

3. මෙම කැලැන්ඩරය සිර ලියාපදිංචි ජේලර් යටතේ පවත්වා ප්‍රධාන ජේලර් හා අධිකාරීගේ අධීක්ෂණයට නතුවිය යුතුය.

4. ප්‍රථමවරට නිවාස නිවාඩු සුදුසුකම සම්පූර්ණ කරන සිරකරුවන්ගේ නාම ලේඛණය එම දිනයට මාස 06 කට පෙර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම පිණිස ආයතනයේ පුනරුත්ථාපන නිලධාරීන්ට ලිඛිතව භාර දී එහි පිටපතක් පුනරුත්ථාපන කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

5. ප්‍රථම නිවාස නිවාඩු අවස්ථාවෙන් පසු ඊළ!ග නිවාස නිවාඩු අවස්ථාවට සුදුසුකම් ලබන දිනයට දින 14 කට පෙර එම සිරකරුවන්ගේ නාමලේඛණය පුනරුත්ථාපන නිලධාරීට ලිඛිතව ලබා දිය යුතු අතර, ඊළ!ග නිවාස නිවාඩුවට සුදුසුකම් සපුරන දිනයේ සිට දින 14 ක් ඇතුළත නිවාස නිවාඩු මණ්ඩල නිර්දේශ අමාත්‍යංශ අනුමැතියට යැවීමට බන්ධනාගාර මූලස්ථානයට යොමුකලකළ යුතුය.

6. නිවාස නිවාඩු මණ්ඩල නිර්දේශයන් සුදුසුකම සම්පූර්ණ කරන දිනයේ සිට දින 14 ක් තුළ ඉදිරිපත් කිරීමට නොහැකි වන අවස්ථාවලදී, එසේ ප්‍රමාද වීමට හේතු නිර්දේශය සමග වෙනම ඉදිරිපත් කළ යුතු අතර, නිලධාරීන්ගේ ප්‍රමාදයක් මත සිදුවී ඇත්නම් ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගයද ඉදිරිපත් කළ යුතුය.

7. මෙපරිද්දෙන් ක්‍රියා නොකිරීම පිළිබඳව වගකීම ආයතන භාර අධිකාරීන් සහ සහකාර අධිකාරී සතු වන බව දන්වමි.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.